**පෝරතිවු පත්තු ප්‍රාදේශීය සභාව - 2017**

**මඩකලපුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 22 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 13 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පෝරතිවු පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහයපොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) 2015 වර්ෂයේ වැඩ අවසන් කළ කර්මාන්ත 02ක් සඳහා රු.2,192,749 ක් 2016 වර්ෂයේදී ලැබී තිබුණි. මේ අනුව ජංගම ණයහිමියෝ ගිණුම හර වශයෙන්ද, මූලධන ආධාර ගිණුම බැර කිරීම වෙනුවට ජංගම ණයහිමියෝ ගිණුමෙහි හර හා බැර සටහන් තබා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ගම්මාන සංවර්ධනය කිරීමේ සැලැස්ම යටතේ ලැබී තිබුණු රු.2,612,435 ක් වැය කර තිබුණි. මෙහිදී ද්‍රව්‍ය වියදම් ගිණුමට හර හා මූලධන ආධාර ගිණුම බැර කිරීම වෙනුවට තැන්පත් ගිණුම හරහා හර හා බැර සටහන් තබා තිබුණි.

#### 1.3.2 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි නිශ්චල දේපල හඳුනා ගෙන ඒවායේ වාර්ෂික වටිනාකම තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. |

**(ආ) 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති**

| | |
|---|---|
| (i) X පරිච්ඡේදයේ 193 වගන්තිය | වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර අයවැය ඇස්තමේන්තුව සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශය පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) XIII පරිච්ඡේදයේ 218 වගන්තිය | තක්සේරු මණ්ඩලය විසින් සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වාර්තා නිකුත් කර නොතිබුණි. |

**(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

---

| | |
|---|---|
| **(i)** මුදල් රෙගුලාසි 177(2) | 2016 මාර්තු 09 දින සිට 2017 ඔක්තෝබර් 31 දින දක්වා 27 වතාවක් එක්රැස් කළ මුදල් රු.370,083 ක් ඊළඟ දිනයේ තැන්පත් කළ යුතු වුවත්, අවම වශයෙන් දින 15 ක කාල ප්‍රමාදයකින් පසුව තැන්පත් කර තිබුණි. |
| **(ii)** මුදල් රෙගුලාසි389 | නියම ගෙවීම්ලාභින්ට හා අයිතිකරුට චෙක්පත් සෘජුවම හෝ ලියාපදිංචි තැපෑලෙන් යැවීම වෙනුවට ප්‍රාදේශිය සභාවේ සේවය කරන නිලධාරියෙකු විසින් ලබාගෙන තිබුණි. |
| **(iii)** මුදල් රෙගුලාසි 1645 සහ 1646 | වාහනවලට අදාල සෑම මාසයකම ධාවන සටහන් සහ මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 වැනි දිනට ප්‍රථම විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, සභාව විසින් භාවිතා කරනු ලබන වාහනවලට අදාල ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඈ) 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය | වටිනාකම රු.10,207,767 ක් වන ඉදිකිරීම් කාර්යයන් සඳහා නිර්දේශිත සංගම් තෝරා ගැනීමේදී මෙම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.4,356,779 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 536,986 ක් වූ හෙයින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,819,793 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

### 2.2 ආදායම් කළමනාකරණය

---

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

---

2012 පෙබරවාරි 07 දිනැති අංක 1775 දරන ගැසට් පත්‍රයේ දැන්වීම අනුව පෝරතිවුපත්තු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ගම්මාන 05ක ග්‍රාම නිලධාරී වසම් 12 ක් සංවර්ධිත ප්‍රදේශ ලෙස ප්‍රසිද්ධ කර තිබූ නමුත් වරිපනම් බදු ආදායම් අයකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 කාර්යසාධනය

---

(අ) **තිරසාර සංවර්ධන අරමුණු**

---

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ළඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

---

සභා බල ප්‍රදේශයේ පිහිටි විවේකානන්දපුරම් යන ස්ථානයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා 2016 නොවැම්බර් 27 දින රු.1,822,222 ක් වැය කර තිබුණි. මෙම ප්‍රදේශයේ වන අලීන් ගැවසීම අධික වී තිබූ අතර එය වැලැක්වීම සඳහා අලි වැට ඉදිකිරීමේ කාර්යයන් කිසිවක් ක්‍රියාත්මක නොවීමෙන් සාමාන්‍යයෙන් කොන්ක්‍රීට් කණු 24 ක් සහ දිග 21.5 m අත්තිවාරමද අලීන් විසින් කඩා බිඳ දමා තිබුණි. ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා 2018 මැයි 11 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් 2016 පෙබරවාරි 11 දින ලැබී තිබූ ලිපිය ප්‍රකාරව, 39 වැනි ගම්මානයේ ඉහත වැඩසටහනේ ජල පරීක්ෂණ වාර්තාව අනුව බීමට සුදුසු ජලයේ පැහැය, කැළඹිලි තත්ත්වය (N.T.U) සහ NH3 පිළිවෙලින් 15, 2 හා 0.06 වශයෙන් තිබිය යුතු වුවත් ලබාගෙන තිබූ ජල පරීක්ෂණය අනුව, ඒකක පිළිවෙලින් 241, 37.3 සහ 0.33 ක් වශයෙන් පැවති අතර, එය නිවැරදි කිරීමට කටයුතු නොකර සභාව විසින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරමින් තිබුණි.

(ආ) 2013 වර්ෂයේ දැයට කිරුළ වැඩසටහන යටතේ රු.7,232,236 ක වටිනාකමට සභා බල ප්‍රදේශයට අයත් සින්නවත්තෙයි ගම්මානයේ මහජන පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා විසින් කොන්ත්‍රාත්කරුවකු සමඟ 2013 ජනවාරි 31 දින ගිවිසුම්ගත වී තිබුණි. මෙයට අනුව, රු.1,935,435 ක් වටිනා කාර්යයන් නිමකර ඒ සඳහා ගෙවීම් 2014 පෙබරවාරි 24 දින සිදු කර තිබුණි. එසේ වුවත්, මේ දක්වා ඉදිකිරීම් කාර්යයන් නිම වී නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආදායම් පරීක්ෂක තනතුරට අනුමත සේවක සංඛ්‍යාව 03 ක් වුවද, එක් අයකු පමණක් 2014 වර්ෂයේ සිට රාජකාරී සඳහා අනුයුක්ත කර තිබුණි.

(ආ) පුස්තකාලයාධිපති තනතුරේ අනුමත සේවක සංඛ්‍යාව 03 ක් වුවද, මෙම තනතුර සඳහා සමාලෝචිත වර්ෂයේ කිසිඳු නිලධාරියෙකු බඳවා ගෙන නොතිබුණි.

(ඇ) රියදුරු තනතුරු සඳහා අනුමත කළ සේවක සංඛ්‍යාව 06 ක් වුවද, තිදෙනෙකු පමණක් සමාලෝචිත වර්ෂයේ බඳවාගෙන තිබුණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය**

2016 වර්ෂයේ ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ මාර්ග අලුත්වැඩියා කිරීම්, වැසිකිළි අලුත්වැඩියා කිරීම්, මාර්ගවලට නාම පුවරු ස්ථාපිත කිරිම, ළමා උද්‍යාන ඉදිකිරීම, පානීය ජල පහසුකම් සැපයීම, කාණු පහසුකම් සැලසීම ආදී වැඩසටහන් 10 ක් නිම කළ බවට 2016 වර්ෂයේ වාර්තා ඉදිරිපත් කර ලබාගත් රු.2,350,000 ක් 2017 වර්ෂයේ තැන්පත් කර තිබූ නමුත් 2018 මැයි 11 දින වන විටත් එම කාර්යයන් නිමකර නොතිබුණි.

4. **ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිතසමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බදු රු.1,050,000 ක් රැස්කිරීමට සහ පොළ ව්‍යාපාර බදු ආදායම් රු.250,000 ක් ඇස්තමේන්තු කර තිබුණත් කිසිඳු අයකර ගැනීමක් සිදු කරනොතිබුණි.

**5.** **පද්ධති හා පාලන**

**-------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| **පාලන ක්ෂේත්‍රය** | **විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන්** |
|---|---|
| (අ) **ගිණුම් තැබීම** | **ලැබිය යුතු හා ගෙවිය යුතු ඒවා සඳහා ගිණුම් තැබිය යුතුය.** |
| (ආ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) අයවැය පාලනය | අයවැය පිළියෙල කිරීමේදි ලබාගත හැකි ආදායම් පිළිබඳ සැලකිල්ලට ගත යුතුය. |